සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
10	ඉතිහාසය	I	පැය 01

නම/විභාග අංකය:-.....

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(01) මහාවංසයේ මුල් කොටස රචනා වී ඇත්තේ කවර භාෂාවකින් ද?

1. සංස්කෘත 2. සිංහල 3. පාලි 4. ප්‍රාකෘත

(02) ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති දේ දැක බලා මෙරට පිළිබඳ තොරතුරු වාර්තා කර තැබූ දේශාටකයෙකු වන්නේ,

1. ෆිලිප්පස් බැල්ඩියස් ය. 2. හියුං සියෑං ය.
3. මෙගස්තීනස් ය. 4. ෆර්නාඕ ඩි ක්වේරෝස් ය.

(03) වසර 12,500 පමණ පැරණි ගල් යුගයේ සාක්ෂි හමුවන ස්ථානය මින් කුමක් ද?

1. මාතොට 2. සීගිරිය
3. පතිරාජවෙල 4. බෙල්ලන්බැඳිපැලැස්ස

(04) මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයා කැලෑ දෙල් පුළුස්සා ආහාරයට ගත් බවට සාක්ෂි හමුවන්නේ මින් කුමන ස්ථානයෙන් ද?

1. අලිගල 2. කුරුවිට බටදොඹලෙන
3. පාහියන්ගල ලෙන 3. කිතුල්ගල බෙලිලෙන

(05) පූර්ව ඓතිහාසික යුගයේ සකපෝරුව භාවිත කර මැටි භාණ්ඩ නිපදවීමේ තාක්ෂණය පැවති බවට පුරාවිද්‍යාත්මක තොරතුරු හමුවන ස්ථානය වන්නේ,

1. අලිගල ය. 2. රංචාමඩම ය.
3. මාතලේ ය. 4. උඩරංවාමඩම ය.

(06) අතීත සමාජයේ 'කසීකාරගාම' යන නමින් හැඳින්වූයේ කවර වෘත්තිකයින් වාසය කළ ගම් ද?

1. වඩුවන් විසූ ගම් 2. වළං සාදන්නන් විසූ ගම්
3. ධීවරයින් විසූ ගම් 4. ගොවියන් විසූ ගම්

(07) ක්‍රිස්තු පූර්ව යුගයේ බ්‍රාහ්මී සෙල්ලිපිවල 'පුර කමත' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. නගර පාලකයා ය.
2. නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා ය.
3. නගරයේ ප්‍රධාන කම්මල්කරුවා ය.
4. නගර පාලකයින් රැස්වන ස්ථානය ය.

(08) පැරණි සමාජයේ ගමික වරයෙකු සතු කාර්යයක් නොවූයේ පහත සඳහන් කවර කාර්යයක් ද?

1. ග්‍රාම සීමා ලකුණු කිරීම 2. ගමට අයත් වැව නඩත්තු කිරීම
3. ගමේ ආරවුල් විසඳීම 4. වැව් ජලය බෙදාහැරීම

Past Papers Wiki

(09) පරුමකවරුන් මධ්‍යගත පාලනයට සම්බන්ධ කර ගනිමින් කේන්ද්‍රීය රාජ්‍ය පාලනයක් ඇති කිරීමට පුරෝගාමී වූ පාලකයා වන්නේ,

1. පණ්ඩුකාභය රජතුමා ය.
2. දුටුගැමුණු රජතුමා ය.
3. පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය.
3. වසභ රජතුමා ය.

(10) අතීතයේ 'චක්‍රවර්තීරාජ' සංකල්පයෙන් මෙරට පාලනය කළ රජෙකු වන්නේ,

1. මහසෙන් රජතුමා ය.
2. පළමුවන කාශ්‍යප රජතුමා ය.
3. කුටකණ්ණාභය රජතුමා ය.
4. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා ය.

(11) ඉතා දුෂ්කර සටන් ව්‍යාපාරයක් දියත් කිරීම, ශක්තිමත් විදේශ සම්බන්ධතා ඇති කර ගැනීම හා නව පාලන මධ්‍යස්ථානයක් පිහිටුවීම යන කරුණු හා ගැළපෙන පාලකයා කවුරුන් ද?

1. නිශ්ශංකමල්ල රජතුමා
2. පළමුවන පරාක්‍රමබාහු රජතුමා
3. පළමුවන විජයබාහු රජතුමා
4. මහසෙන් රජතුමා

(12) චීනය සමඟ වාණිජ හා සංස්කෘතික සම්බන්ධතා වර්ධනය කර ගැනීමේ අරමුණින් විසි වතාවක් චීනය හා දූත සම්බන්ධතා පැවැත්වූ රජතුමා වන්නේ,

1. පළමුවන ගජබාහු රජතුමා ය.
2. දෙවන විජයබාහු රජතුමා ය.
3. හයවන අග්ගබෝධි රජතුමා ය.
4. හතරවන කාශ්‍යප රජතුමා ය.

(13) පහත සෙල්ලිපි අතුරින් රෙදි විවීමේ කර්මාන්තය පිළිබඳ නිසැක සාක්ෂි සපයන සෙල්ලිපිය කුමක් ද?

1. වෙහෙරකෙම ලිපිය
2. මණ්ඩගල ලිපිය
3. මුතුගල්ල ලිපිය
4. මැදගම පුරාණ විහාර ලිපිය

(14) දෙමළ ජනයාගේ වන්දනාවට පාත්‍රවන ගෝකණ්ණතිත්ථ වරායට සමීපව පිහිටා ඇති හින්දු කෝවිල වන්නේ,

1. කෝණේශ්වරම් කෝවිල ය.
2. නල්ලූර් කෝවිල ය.
3. තිරුකේතීශ්වරම් කෝවිල ය.
4. කන්දස්වාමි කෝවිල ය.

(15) ලීලාවතී රැජිණගේ රාජ්‍ය සමයේ රේගු මුරපොළක් පවත්වාගෙන ගිය දකුණු ඉන්දියානු වෙළෙඳ කණ්ඩායම හැඳින්වූ නාමය කුමක් ද?

1. අයින්නූරුවර්
2. නානාදේසීන්
3. වලඤ්ඤියාර්
4. කබොජ

(16) පුරාණ කාලයේ ඇළ මාර්ග සම්බන්ධව කටයුතු කළ නිලධාරීන් හැඳින්වූ නාමය කුමක් ද?

1. මොහොල්නගා
2. මේකාප්පර්
3. අඩික
4. කනපෙඩික

(17) අඹන් ගඟ හරස් කොට ජලය ගෙන මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල හා කන්තලේ යන වැව් වලට ජලය සපයන ඇළ මාර්ගය වන්නේ,

1. මිණිපේ ඇළ ය.
2. පබ්බතන්ත ඇළ ය.
3. ඇළහැර ඇළ ය.
4. යෝධ ඇළ ය.

(18) ස්වභාවිකව ජනනය වන පීඩනය භාවිතා කරමින් අලංකාර ජල පොකුණු නිර්මාණය කර ඇති ස්ථානය මින් කුමක් ද?

1. කුට්ටම් පොකුණ
2. ඇත් පොකුණ
3. නෙළුම් පොකුණ
4. සීගිරි ජල පොකුණු

(19) පැරණි රෝහලක නටඹුන්, ශල්‍යකර්ම සඳහා භාවිතා කළ මෙවලම්, වෛද්‍ය පොත් හා බෙහෙත් ඔරු ආදී වෛද්‍ය ශාස්ත්‍රයේ දියුණුව පෙන්වන නටඹුන් හමුවී ඇති ස්ථානය වන්නේ,

1. මැදිරිගිරි විහාරය යි.
2. පොළොන්නරුව ආලාහන පිරිවෙන යි.
3. සිතුල්පව්ව විහාරය යි.
4. මාතලේ අලුවිහාරය යි.

(20) පැරණි සමාජයේ 'වදාළ' යන නමින් හැඳින්වූයේ,

1. අධිකරණය යි. 2. ව්‍යවස්ථාදායකය යි. 3. විධායකය යි. 4. රජු ය.

(21) ක්‍රිස්තු පූර්ව යුගයේ උතුරු ඉන්දියාවේ සිට පැමිණි වෙළෙඳුන් විසින් මෙරටට ගෙන එනු ලැබූ රිදී කාසි පුරාවිද්‍යාඥයින් විසින් හඳුන්වන ලද නාමය කුමක් ද?

1. අශෝක කාසි 2. රන් කාසි 3. කහාපණ 4. හස්එබූ කාසි

(22) පැරණි සමාජයේ රජුට අයත් ඉඩම් වගා කිරීම වෙනුවෙන් අය කළ බද්ද හැඳින්වූයේ,

1. බොජකපති යනුවෙනි. 2. දකපති යනුවෙනි.
3. කැතිඅඩ යනුවෙනි. 4. කෙටූකනබ අය යනුවෙනි.

(23) පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා උස් ගොඩබිම්වල කැලෑ නොකැපිය යුතු බවට නීති පැනවූ රජු කවුද?

1. හතරවන මිහිඳු රජු 2. පස්වන කාශ්‍යප රජු
3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු 4. පළමුවන ගජබාහු රජු

(24) ප්‍රමිතිගත මදටිය බර (තරාදි පඩි) භාවිතා කිරීම, බුලත් පුවක් ගුණාත්මක බවින් යුක්තව වෙළෙඳාම් කිරීම, පොහොය දිනවල වෙළෙඳාම් කරන්නන්ගෙන් දඩ අය කිරීම ආදි කරුණු පිළිබඳව නීති පැනවූ රජතුමා කවුද?

1. දෙවන සේන රජතුමා ය. 2. පළමුවන ගජබාහු රජතුමා ය.
3. හතරවන උදය රජතුමා ය. 4. ආමණ්ඩගාමිණී අභය රජතුමා ය.

(25) අතීතයේ අඹු, හඹු කාඩි යනුවෙන් හැඳින්වූයේ කුමන ආහාරය ද?

1. ව්‍යංජන නියඹලාව ය. 2. කුළුබඩු වර්ග ය.
3. අතුරුපස වර්ග ය. 4. කැඳ වර්ග ය.

(26) A හා B තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

A	B
1. පළමුවන විජයබාහු රජු	A. දඹදෙණියේ නව පාලන මධ්‍යස්ථානයක් ගොඩනැගීම
2. පළමුවන බුවනෙකබාහු රජු	B. පොළොන්නරුව අගනුවර බවට පත් කර ගැනීම
3. තුන්වන විජයබාහු රජු	C. කුරුණෑගල රාජධානියේ ප්‍රථම පාලකයා වීම
4. දෙවන බුවනෙකබාහු රජු	D. කාලිංගරායර් හා චෝඩගංග ආක්‍රමණ මර්ධනය කිරීම

1. ADCB 2. BDAC 3. BDCA 4. DACB

(27) පහත සඳහන් ස්ථාන අතරින් අග්නිදිග ආසියාතික වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්වන ගොඩනැගිලි නිර්මාණය කුමක් ද?

1. සත්මහල් ප්‍රාසාදය 2. ථූපාරාම පිළිමගෙය
3. නිශ්ශංකලතා මණ්ඩපය 4. ආලාහන පිරිවෙන

(28) මාඝ පළවා හැරීම, ආගමික හා අධ්‍යාපනයේ උන්නතියට කටයුතු කිරීම යන සේවාවන් සිදු කළ දඹදෙණි යුගයේ පාලකයා වන්නේ,

1. තුන්වන විජයබාහු රජු ය. 2. දෙවන පරාක්‍රමබාහ රජු ය.
3. හතරවන විජයබාහු රජු ය. 4. පළමුවන බුවනෙකබාහු රජු ය.

(29) ගම්පොළ රාජ්‍ය සමයේ මෙරටට ආක්‍රමණයක් එල්ල කළ චීන සෙන්පතියා කවුද?

1. චන්ද්‍රබානු 2. චෙං හෝ 3. හියුං සාං 4. ෆාහියන්

(30) ගම්පොළ යුගයේ ඉදි කරන ලද දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ දක්නට ඇති ගොඩනැගිල්ලක් වන්නේ මින් කුමක් ද?

1. ගඩලාදෙණි විහාරය 2. ථූපාරාම පිළිමගෙය
3. සත්මහල් ප්‍රාසාදය 4. විජයසුන්දරාරාමය

(31) භයවන පරාක්‍රමබාහු රජු විසින් තම මෑණියන් සිහිවීම පිණිස ඉදි කරන ලද පිරිවෙන වන්නේ,
1. කෑරගල පද්මාවතී පිරිවෙන ය.
2. විද්‍යාලංකාර පිරිවෙන ය.
3. වීදාගම ගණානන්ද පිරිවෙන ය.
4 පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන ය.

(32) ක්‍රි. ව. 1580 දී පළමුවන රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය කිරීම සඳහා සහාය දුන් උඩරට ප්‍රභුවරයා කවුද?
1. කරලියැද්දේ බණ්ඩාර
2. වීරසුන්දර බණ්ඩාර
3. කොනප්පු බණ්ඩාර
4. ජයවීර බණ්ඩාර

(33) A දන්තුරේ සටනින් පෘතුගීසින් පරාජයට පත් කිරීම
B බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම
C කපු වගාව දියුණු කිරීමට අනුබල දීම

ඉහත දක්වා ඇති කාර්යයන් කරන ලද රජතුමා කවුරුන් ද?
1. දෙවන රාජසිංහ රජතුමා
2. සෙනරත් රජතුමා
3. පළමුවන විමලධර්මසූරිය රජතුමා
4. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා

(34) නායක්කාර් රාජවංශයේ පළමු පාලකයා කවුද?
1. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
2. ශ්‍රී විජය රාජසිංහ රජතුමා
3. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
4. පළමුවන රාජසිංහ රජතුමා

(35) මහවාසල නිලධාරියෙකු නොවන්නේ කවර නිලධාරියා ද?
1. හළු වචන නිළමේ
2. අස්පන්තියේ මුහන්දිරම්
3. මඩිගේ මුහන්දිරම්
4. ගජනායක නිලමේ

(36) පුනරුද සමයේ සිස්ටයින් දෙව්මැදුරේ දේව දරුවන් දෙදෙනා සිතුවමට නැගූ චිත්‍ර ශිල්පියා කවුරුන් ද?
1. මයිකල් ආන්ජලෝ
2. ලියනාඩෝ ඩාවින්චි
3. මැසැක්ෂියෝ
4. රෆායල්

(37) වෛද්‍ය විද්‍යාවේ දියුණුවක් ඇති කරමින් රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු සොයාගත් විද්‍යාඥයා වන්නේ,
1. ගුටෙන්බර්ග් ය.
2. පැරසෙල්ස් ය.
3. ජොහැන්ස් කෙප්ලර් ය.
4. විලියම් හාවේ ය.

- ප්‍රශ්න අංක 38 හා 39 සඳහා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

I	II	III
A 1594	D පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම පිහිටුවීම	I පළමුවන විමලධර්මසූරිය රජු උඩරට රජ වීම
B 1521	E විජයබා කොල්ලය	J සිංහල - ලන්දේසි දූත සම්බන්ධතා ඇරඹීම
C 1602	F දන්තුරේ සටන	K කුමාරවරු තිදෙනෙක් අතර රාජ්‍යය බෙදී යාම

(38) කෝට්ටේ රාජ්‍යයේ දේශපාලන තත්ත්වය කෙරෙහි ප්‍රබල ලෙස බලපෑ තොරතුරු සඳහන් තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

1. AFJ
2. BEK
3. BDK
4. CEI

(39) ලංකාවේ ලන්දේසි බල ව්‍යාප්තිය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

1. ADJ
2. AFI
3. CDJ
4. CDK

(40) පෘතුගීසින් පළවාහැරීමේ අරමුණින් ලන්දේසීන් සමග 1638 දී ගිවිසුමකට එළඹි රජතුමා,
1. පළමුවන විමලධර්මසූරිය රජතුමා
2. සෙනරත් රජතුමා
3. දෙවන රාජසිංහ රජතුමා
4. පළමුවන රාජසිංහ රජතුමා

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
10	ඉතිහාසය	II	පැය 03

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න කියවා තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :-
- I කොටසේ ප්‍රශ්න අංක (01) අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකටද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

(01)(අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

බුන්දල, ලංකා පටුන, දඹකොලපටුන, වළවේ ගඟ, මාතොට, කලා වැව, සෙංකඩගල, දෙවිනුවර, පරාක්‍රම සමුද්‍රය, මහවැලි ගඟ, කෝණේශ්වරම් කෝවිල, කාචරගාම

(ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

මලක්කා සමුද්‍ර සන්ධිය, මධ්‍යධරණී මුහුද, ජාවා දූපත, කොන්ස්තන්තිනෝපල්, පෘතුගාලය, පර්සියන් බොක්ක

(ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න සියල්ලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - විදේශීය පබළු ගෙන්වා රුවන්වැලිසෑයට පූජාවක් පැවැත්වූ රජතුමා කවුද?

B - වේලෙයික්කාර හමුදාව යොදවා දළදා මාළිගයට ආරක්ෂාව සැපයූ රජතුමාගේ නම සඳහන් කරන්න.

C - කව්සිළුමිණ නම් ශ්‍රේෂ්ඨ කාව්‍යය රචනා කළ රජතුමා කවුද?

D -ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරයේ කලාත්මක කටයුතුවලට අනුග්‍රහය දැක්වූ ධනවත් පවුල කුමක් ද?

(ලකුණු 04)

- **A** හා **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.



A

(ii)

1. **A** රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය හමුවූ ස්ථානය නම් කරන්න.
3. මෙම නිර්මාණය හමුවූ ස්ථානය හා සම්බන්ධතාවයක් දක්වන රජතුමා නම් කරන්න.
4. මෙම නිර්මාණයේ දක්නට ඇති භෞතික විද්‍යාත්මක මූලධර්මය නම් කරන්න.

(ලකුණු 04)

Past Papers Wiki

(iii)



B

1. **B** රූපයෙන් නිරූපණය වන්නේ කවුද?
2. ඔහු කුමන ජාතිකයෙක් ද?
3. ඔහු විසින් සොයාගන්නා ලද එක් සොයාගැනීමක් නම් කරන්න.
4. ඔහු හැඳින්වූ අන්වර්ථ නාමය සඳහන් කරන්න.

(ලකුණු 04)

II කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ලෙන් වාසස්ථාන තුනක් නම් කරන්න.

(ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජනාවාසවල මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ පැවති අවමංගල්‍ය චාරිත්‍රවිධි දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(03) (i) පහත සඳහන් සේවාවන් සිදු කළ රජවරුන් නම් කරන්න.

A - අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය බවට පත් කළ රජතුමා

B - ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරය මෙහෙය වූ රජතුමා

C - ලම්භකර්ණ වංශයේ ආරම්භක රජතුමා

(ලකුණු 03)

(ii) රාජත්ව සංකල්ප හතරක් ලියා දක්වන්න.

(ලකුණු 04)

(iii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිදු වූ ඓතිහාසික සිදුවීම් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) අතීත සමාජයේ රජතුමාගෙන් රට වැසියාට ඉටු විය යුතු යුතුකම් ලෙස රජවරු සැළකූ කරුණු තුනක් විස්තර කරන්න.

(ලකුණු 06)

(04) (i) අතීතයේ හේන්වල වගා කරන ලද ධාන්‍ය වර්ග 3 ලියන්න.

(ලකුණු 03)

(ii) පහත සඳහන් විස්තරවලට අදාළ පැරණි නාමය වරහන තුළින් තෝරා ලියන්න.

A - හේන් වගා කිරීම වෙනුවෙන් අය කළ බද්ද

B - කිරි ලබා ගැනීම සඳහා ඇති කරන ලද ගවයින්

C - වෙළෙඳාමේ නියුක්ත වූ පිරිස්

D - ජනතාව විසින් අතහැරදැමූ වැව්ගම්

(කිරි ගෙරි / වාපර / කැති අඩ / දඬුවැට / තොටබොජක / පිටිබිම් / ඔළගම්)

(ලකුණු 04)

(iii) අතීතයේ ශ්‍රී ලංකාවේ රජවරු අසල්වැසි රටවල් සමග සම්බන්ධතා පැවැත් වූ ආකාර දෙකක් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) පැරණි ලංකාවේ දේශීය වෙළෙඳාම ක්‍රියාත්මක වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න..

(ලකුණු 06)

(05) (i) පහත සඳහන් සේවාවන් සිදු කළ රජවරුන් නම් කරන්න.

A - තිස්සමහාරාම වැව ඉදිකිරීම

B - විශේෂ උණ රෝහල් (උපසග්ගරෝගනාස) ඉදිකිරීම

C - මාවත්වල ගව් කණු සිටුවීම

(ලකුණු 03)

(ii) පහත සඳහන් කාර්යයන් සිදු කරන වැවක කොටස් වරහන තුළින් තෝරා ලියන්න.

A - වැව් බැම්ම බාදනය වීම වැළැක්වීමට යොදා ඇති ව්‍යුහය

B - වැව් ජලය පිටතට ගැනීම සඳහා ඉදිකර ඇති ව්‍යුහය

C - ජල ප්‍රමාණය මැන සොරොව්වෙන් ජලය මුදා හැරීමට යොදා ගන්නා ගල් කුළුණ

D - සොරොව්වෙන් ජලය පිටකිරීමේදී අවම පීඩනයක් ඇති කිරීමට යොදා ඇති ව්‍යුහය

(පිටවාන / රළ පනාව / වැව් බැම්ම / සොරොව්ව / බිසෝකොටුව / දියකැටපහන)

(ලකුණු 04)

(iii) පුරාණයේ යකඩ නිස්සාරණ ක්‍රියාවලිය සිදු කළ ආකාර දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) පැරණි සමාජයේ පැවැති වාස්තු විද්‍යාත්මක දැනුම උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(06) (i) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු පහත සඳහන් ස්ථානවල පාලන මධ්‍යස්ථාන පිහිටුවාගත් ප්‍රාදේශීය පාලකයින් නම් කරන්න.

A - යාපහුව

B - ගෝවින්දමලය

C - ගංදෙණිය (මිණිපේ)

(ලකුණු 03)

(ii) දඹදෙණියේ තුන්වන විජයබාහු රජු අතින් සිදු වූ සේවාවන් දෙකක් ලියන්න.

(ලකුණු 04)

(iii) ගම්පොළ රාජ්‍ය සමයේ මෙරට දේශපාලනයේ කැපී පෙනුන ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 05)

(iv) කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජු සමයේ භාෂාවේ හා සාහිත්‍යයේ ඇති වූ ප්‍රබෝධය කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(07) (i) අතීතයේ මහනුවර රාජධානිය හැඳින් වූ නම් තුනක් ලියන්න.

(ලකුණු 03)

(ii) පළවන විමලධර්මසූරිය රජුගේ දේශපාලන සේවාවන් දෙකක් ලියන්න

(ලකුණු 04)

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමයේ ඇති වූ බෞද්ධාගමික ප්‍රබෝධය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) උඩරට රාජ්‍ය තුළ පෘතුගීසි බලය පැතිරවීමට ගන්නා ලද උත්සාහයන් දෙකක් දක්වා ඒවා අසාර්ථක වූයේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

III කොටස

(08) (i) පුනරුද සමයේ බිහි වූ නව අධ්‍යාපන ආයතනවල ඉගැන්වූ විෂයයන් තුනක් නම් කරන්න.

(ලකුණු 03)

(ii) පහත සඳහන් සිදුවීම්වලට අදාළ පුද්ගලයින් වරහන තුළින් තෝරා ලියන්න.

A - ඩිවිනා කොමිඩියා ග්‍රන්ථය රචනා කළ පුද්ගලයා

B - මුද්‍රණ යන්ත්‍රය නිපද වූ පුද්ගලයා

C - 'අන්තිම භෝජන සංග්‍රහය' චිත්‍රණය කළ ශිල්පියා

D - පියෙටා ප්‍රතිමාව නිර්මාණය කළ ශිල්පියා

(ලියනාඩෝ ඩාවින්චි / මාටින් ලූතර් / අලගියරි ඩාන්ටේ / මයිකල් ආන්ජලෝ / ගුටෙන්බර්ග් / රෆායල්)

(ලකුණු 04)

(iii) පුනරුද සමයේ භාෂාවේ හා සාහිත්‍යයේ ඇති වූ නවෝදය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් තුනක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06)

(09) (i) පුනරුද සමයේ දේශ ගවේශකයින්ට ආධාර කළ යුරෝපීය පාලකයින් තිදෙනෙක් නම් කරන්න.

(ලකුණු 03)

(ii) නව මුහුදු මාර්ග සොයා යෑමේ උනන්දුව වැඩි කිරීමට සමත් වූ සොයා ගැනීම් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(iii) පුනරුදය හේතු කොටගෙන යුරෝපයේ ආර්ථික කටයුතුවල ඇති වූ වෙනස්කම් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)


(iv) මුල් කාලීන දේශ ගවේශන තුනක් සඳහන් කර, එම දේශගවේශකයින් පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 06)


සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

(01) (අ) (i)



(01) (ඇ) (ii)




10 ශ්‍රේණිය - ඉතිහාසය

I පත්‍රය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
1	3	11	3	21	4	31	4
2	1	12	3	22	1	32	2
3	3	13	1	23	1	33	3
4	4	14	1	24	3	34	2
5	4	15	2	25	4	35	3
6	4	16	3	26	2	36	4
7	2	17	3	27	1	37	4
8	1	18	4	28	2	38	2
9	2	19	2	29	2	39	3
10	4	20	2	30	1	40	3


II පත්‍රය

අ i



Past Papers Wiki

අ. ii



(ආ) (i)
A - භාතිකාභය රජතුමා
B - පළවන විජයබාහු රජතුමා
C - දෙවන පරාක්‍රමබාහු රජතුමා
D - මෙඩිවි පෙළපත

(ii) A
1. ඇත්පහණ
2. සූතිගර චෛත්‍යය/ දැදිගම කොටවෙහෙර
3. පළවන පරාක්‍රමබාහු රජතුමා
4. අචල ජල විද්‍යාත්මක මූලධර්මය

B
1. ගැලීලියෝ ගැලිලි
2. ඉතාලි ජාතිකයෙකි
3. දුරදක්නය/ චන්ද්‍ර ආවාට ඇතිබව / බ්‍රහස්පති ගේ උපග්‍රහයන්
4. අත්හදාබැලීමේ පියා

II කොටස

2. i . පාණියන්ගල/ බටදොඹලෙන/ කිතුල්ගල බෙලිලෙන/ පොතාන/ අලිගල

ii. - ආහාර සඳහා ස්වභාවික සම්පත් බහුල ප්‍රදේශ වල ජනාවාස ඇති කර ගැනීම.
- පහසුවෙන් ජලය ලබාගත හැකි ස්ථානවල ජනාවාස ඇතිකර ගැනීම.
- ගල් මෙවලම් තනා ගැනීමට පාෂාණ බහුල ස්ථානවල ජනාවාස ඇති කර ගැනීම.
- පහතරට තෙත් කලාපීය වනාන්තර, විල්ලු, මුහුදුබඩ කළපු/ වියළි කලාපීය වනාන්තර වල ජනාවාස ඇතිකර ගැනීම.
- තෙත් හා වියළි කළාපීය ගල්ගුහා වාසස්ථාන භාවිතා කිරීම
- එළිමහන් වාසස්ථාන යොදා ගැනීම.

iii. ශිලා මංජුසා සොහොන්
හරණී සුසාන
මැටි ඔරු සුසාන ඉදිකිරීම

iv - කුඩා ගම් වැව් කේන්ද්‍ර කොටගෙන ජනාවාස ව්‍යාප්තවී පැවතුනි.
- ඒවා වාපි ගාම නම්විය. උදාහරණ : සුමනවාපී ගාම, විහාරවාපීගාම,හුන්දරීවාපීගාම, කඩහවාපීගාම.
- ගංගා වල පිටාර නිම්නයට පිටතින් ජනාවාස ව්‍යාප්ත වීම.
- ගමක් කැලෑවකින් වෙන්විය.
- නොයෙක් වෘත්තිකයන් විසූ ගම් හා කාර්යයන් පදනම් කරගත් ගම් පැවතුනි.
- ගම වැටකින් ආරක්ෂා කර තිබුණි.
- සාමාන්‍ය ගමක පවුල් 5-6 අතර ප්‍රමාණයන් විය. පවුල් 30 පමණවූ විශාල ගම්ද විය.

3. i A - පණ්ඩුකාභය රජතුමා
B - දුටු ගැමුණු රජතුමා
C - වසභ රජතුමා

ii දේවත්ව/ බෝධිසත්ව/ පර්වතරාජ/ වීරත්ව/ චක්‍රවර්ති

iii - මිහිදු හිමියන් බුදු දහම රැගෙන මෙරටට වැඩම කිරීම
- සංඝමිත්තා තෙරණියගේ පැමිණීම හා ප්‍රාදේශීය නායකයින්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය පැවැත්වීම.
- භික්ෂු-භික්ෂුණී සාසන ඇරඹීම.
- අශෝක අධිරාජ්‍යය හා දූත සම්බන්ධතා පැවැත්වීම, දෙවන වරට අභිෂේකවීම හා දෙවනපිය යන අභිධානය භාවිතයට ගැනීම.
- තිසා වැව ඉදිකිරීම.

iv - රටේ ආර්ථික සංවර්ධනය ඇතිකිරීම
- රටවැසියාට ආරක්ෂාව සැළසීම
- රටවැසියාගේ අධ්‍යාත්මික සංවර්ධනය ගොඩනැගීම

4 i ඇල් වී/උඳු/ මුං/ මෑ/ කුරක්කන්/ ඉරිහු/ තල/ අමු/ අබ/ දුරු/ තණහාල්

ii. A - කැති අඩ
B - කිරිගෙරි
C - වාපර
D - ඔළගම්

iii. - අතීත රජවරු ඉන්දියාව, අරාබිය හා ආසියානික රටවල් සමඟද සමීප සම්බන්ධතා පවත්වා ඇත.
- පළවන ගජබාහු රජු චේර රාජ්‍යයේ පත්තිනි දේව උත්සවයකට සහභාගී වීම
- භාතිකාභය රජතුමා රෝමානු දේශය හා දූත ගමන් සිදු කිරීම
- හයවන අග්ගබෝධී රජු විසිවතාවක් පමණ චීනයට දූත ගමන් යාම.
- පළවන විජයබාහු රජු කාලිංග දේශය හා පාණ්ඩ්‍ය දේශය සමඟ විවාහ සම්බන්ධතා පැවැත්වීම
- ක්‍රි.ව 9 වන සියවස ඉස්ලාමීය රජු සමඟ තෑගි හුවමාරු කරගත් බව අල්-බලසූරි සඳහන් කිරීම.

iv. - වෙළඳාම ප්‍රධාන ජීවන මාර්ගයක් විය.

- අනුරාධපුරය, මාගම වැනි නගර කේන්ද්‍රකොටගෙන වෙළඳපොළ පැවතී ඇත.
  උදාහරණ: අනුරාධපුර දකුණු දොරටුව අසළවූ කාළසුමන වෙළඳපළ
- වෙළෙන්දෝ සමූහ වශයෙන් සංවිධානයවී කටයුතු කර ඇත. 'පූගය' හා 'නියමස්ථාන' යන නමින් එම සංවිධාන හඳුන්වා ඇත.
- වෙළඳාමේ නියුක්තවූවන් 'වනිජ' හෝ 'වාපර' නමින් හඳුන්වා ඇත.
- හතරවන උදය රජුගේ හෝපිටිගමුව වෙළඳපළ ගැන කියැවෙන සොරබොරවැව ලිපිය පුරාණ වෙළඳපලක් සංවිධානාත්මකව පාලනයවූ ආකාරය දක්වා ඇත. (මෙම සෙල්ලිපියේ අඩංගු කරුණුද පිළිතුරු වල ඇතුළත්ව තිබිය හැකිය)

5.i A - ඉළනාග රජු
B - හතරවන කාශ්‍යප රජු
C - කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු

ii. A – රළපනාව
B - සොරොව්ව
C - දියකැටපහන
D - බිසෝකොටුව

iii. - බලංගොඩ සමනළවැව යකඩ නිස්සාරණය ක්‍රමය - ස්වභාවික පරිසරයේ ඇති යකඩ බහුල ලිමොනයිට්, හෙමටයිට් වැනි පාෂාණ මැටි බදුනක දමා අධික උෂ්ණත්වයකට රත් කිරීම සඳහා ස්වභාවික සුළං බලය භාවිතා කිරීම.
- දෙහිගහ ඇළකන්ද යකඩ නිස්සාරණ ක්‍රමය - යකඩ බහුල ගල් අධික උෂ්ණත්වයකට රත් කිරීම සඳහා උදුන් තනා මයිනහමක ආධාරයෙන් සුළං බලය ලබාගෙන උදුන් දැල්වීම.

iv. - වාස්තු විද්‍යාත්මකව වැදගත් බෞද්ධ ගොඩනැගිලි, රාජ මාළිගා, බලකොටු, බෙහෙත්ශාලා ආදී නිර්මාණ රාශියක් තිබීම.
- ජේතවනාරාමය, රුවන්වැලිසෑය සහ අභයගිරිය වැනි මහා ස්තූප ඉදිකර තිබීම හා ඒ සඳහා ශක්තිමත් අත්තිවාරම් හා කොංක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමවේද භාවිතා කර තිබීම.
- ලෝවාමාහාපාය වැනි මහල් කීපයකින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම
- උස් ගොඩනැගිලි සඳහා අකුණු සන්නායක (වජ්‍ර චුම්බට) යොදා තිබීම.

6. i. A - සුභ සෙනවියා
B - බුවනෙකබාහු ආදිපාද
C - සංඛ සෙනවියා

ii. - දඹදෙණිය පාලන මධ්‍යස්ථානය බවට පත්කොටගෙන එය නගරයකට අවශ්‍ය අංගෝපාංග වලින් සමන්විත කිරීම.
- බෙලිගල දළදා මැදුරක් තනවා දළදාව එහි තැන්පත් කරවීම.
- විහාර ආරාම ගොඩනැංවීම හා ප්‍රතිසංස්කරණය කිරීම
- උපසම්පදා මංගල්‍යයක් පවත්වා සංඝ සංශෝධනයක් සිදු කිරීම.
- අභාවයට ගොස්තිබූ පොත්පත් නැවත ලියවීම.
-

iii. - කැපී පෙනෙන ප්‍රභූ පවුල් දෙකක් බලවත් වීම.
- රාජ්‍ය උරුමය මාමාගෙන් බෑනාට (හිටපු රජුගේ සහෝදරියගේ පුත්‍රයාට) හිමිවීම.
- යාපන රාජ්‍යයෙන් ගම්පොළ රාජ්‍යය වෙත බලපෑම් එල්ලවීම.

iv. - හයවන පරාක්‍රමබාහු රජු උගත් පඬිවරයෙකි.
- මෙකල සාහිත්‍යයේ දියුණුවට කටයුතු කල උගත් පඬිවරු රැසක්වූහ.
- මෙකල පැරකුම්බා සිරිත, කාව්‍යශේකරය, බුදුගුණාලංකාරය, ලෝවැඩසඟරාව, ගුත්තිල කාව්‍යය වැනි කෘති හා හංස, පරවි, ගිරා හා සැළලිහිණි ආදී සංදේශ කාව්‍යත් බිහිවිය.

- මෙකල සාහිත්‍යකරණය විවිධ පැතිවලට යොමු විය. භක්ති ශතකය වැනි සංස්කෘත ග්‍රන්ථ රචනා විය.
- පිරිවෙන් රාශියක් බිහිවූ අතර ඒවා මගින් සාහිත්‍යයේ දියුණුවට මහත් සේවාවක් සිදු විය.
- කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැළකෙන්නේ මෙම රාජ්‍ය සමයේ ඇතිවූ සාහිත්‍ය ප්‍රබෝධය නිසාවෙනි.

7. i. සෙංකඩගල නුවර, උඩරට රාජධානිය, කන්දේ නුවර

ii. - සීතාවක රාජධානියේ බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම.
- උඩරට පෘතුගීසි ග්‍රහණයෙන් මුදවා ගැනීම
- පෘතුගීසීන් පළවාහැරීමට ලන්දේසි සහය ගැනීමට උත්සහ කිරීම.

iii. - සියම් දේශයට දූතයින් යවා උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මෙරටට වැඩමවා යළි උපසම්පදාව පිහිටුවීම.
- උඩරට හා පහතරට ප්‍රදේශවල විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීම.
- වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනමා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට සහයවීම.

iv. උඩරට බලය පැතිරවීමට ගන්නා ලද උත්සාහයන් -
1594 දන්තුරේ සටන
1602 බලන සටන
1630 රන්දෙණිවෙල සටන
1638 ගන්නෝරුව සටන

අසාර්ථක වීමට හේතු -
- උඩරට වැසියෝ හැම විටම රජුට සහය දැක්වීම.
- පෘතුගීසි හමුදාවේ සිටි පහතරට ජනයා උඩරටදී රජුට එකතුවීම.
- උඩරටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය.
- උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම

III කොටස

8. i. පැරණි සාහිත්‍ය/ නාට්‍ය/ ශබ්ද විද්‍යාව/ ඉතිහාසය

ii. A – අලගියරි ඩාන්ටේ
B – ජොහැන්ස් ගුටෙන්බර්ග්
C – ලියනාඩෝ ඩාවින්චි
D – මයිකල්ආන්ජලෝ

iii. - ග්‍රීක හා ලතින් භාෂාවෙන් ලියැවුනු පොත්පත් පරිශීලනය වැඩිවීම
- ලතින් හා ග්‍රීක භාෂා ඉගෙනීම විලාසිතාවක් බවට පත්වීම.
- උසස් සාහිත්‍ය කෘති රචනා කළ ගත් කතුවරුන් රැසක් බිහිවීම.(ඉතාලියේ ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ, එංගලන්තයේ ප්‍රැන්සිස් බේකන්, විලියම් ෂේක්ස්පියර්, ප්‍රංශයේ ඉරාස්මස්)

iv. - කලාකරුවන්ට ධනවතුන්ගේ අනුග්‍රහය ලැබීම.
- කලා නිර්මාණ වලදී ලෞකික රසවින්දනයට මුල්තැන දීම.
- එතෙක් ශ්‍රේණි වල නමින් ඉදිරිපත්වූ කලා කෘති ඒවා නිර්මාණය කළ කතෘවරුන්ගේ නමින් ස්වාධීනව ඉදිරිපත්වීම.
- ආගමික නැඹුරුවෙන් මිදී පෞද්ගලිකත්වය ඉස්මතු කෙරෙන කලා කෘති බිහිවීම.

Past Papers Wiki

9. i. නාවික හෙන්රි කුමාරයා/ පර්ඩිනන්ඩ් රජු/ ඉසබෙලා රැජිණ

ii. මාලිමා යන්ත්‍රය සොයාගැනීම/ උතුරු තරු මාපකය නිපදවීම/ ලෝකය ගෝලාකාරබව සොයාගැනීම.

iii. - ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය පරිහානියට පත්වී වෙළඳාමේ දියුණුවක් ඇතිවීම.
- වෙළඳ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම.
- යුරෝපා රටවල ජාතික වෙළඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම ඇරඹීම.
- මුදල් භාවිතය වැඩිවීම.

iv. - අප්‍රිකාවේ දකුණු තුඩුව (කුණාටු තුඩුව) - බර්තොලමියුඩයස්
- ඉන්දියාවේ කැලිකට් දක්වා පැමිණීම - වස්කෝ ද ගාමා
- බටහිර ඉන්දියා දූපත් - ක්‍රිස්ටෝපර් කොළොම්බස්
- ඇමරිකාව (නව ලෝකය) - ඇමරිගෝ වෙස්පුසී
- පිලිපීනය - පර්ඩිනන්ඩ් මැගලන්
- කැනඩාව - කැබේ සහෝදරයෝ

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library